# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1811/7 – 2013 මැයි 22 වැනි බදාදා – 2013.05.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ ඇල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කුඹල්වෙල කෝරළේ සුළු කොට්ඨාසයේ, ඇල්ල නගර සීමාවේ (න.මැ.මු.පි. 11) පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක බී/ඒඑල්එල්/2012/425 සහ 2012 ඔක්තෝබර් මස 31 දිනැති ප්‍රගමන අනුරේඛනයේ ප්‍රමාණයෙන් හෙක්. 0.3035ක් වූ කීනලන් වත්ත නමැති ඉඩමට මායිම්:

**කැබලි අක්ෂර 'ඒ' – කීනලන් වත්ත – ප්‍රමාණය: හෙක්. 0.3035 ක් පමණ**

උතුරට: මාර්ගය (මා.සං.අ.) සහ නමුණුකුල වැවිලි සමාගම හිමිකම් කියන කීනලන් වත්ත; නැගෙනහිරට: නමුණුකුල වැවිලි සමාගම හිමිකම් කියන කීනලන් වත්ත සහ මාර්ගය (ප්‍රාදේශීය සභා); දකුණට: නමුණුකුල වැවිලි සමාගම හිමිකම් කියන කීනලන් වත්ත; බටහිරට: නමුණුකුල වැවිලි සමාගම හිමිකම් කියන කීනලන් වත්ත සහ මාර්ගය (මා.සං.අ.).

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

යොමු අංකය: 4/3/9/2012/ඩබ්එස්/197.
2013 මාර්තු මස 01 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

06 - 93


1A – G 17686 – 350 (2013/05) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අතිවිශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*